සැ. යු. - 2012.03..02 දින පළ වූ අංක 1,748 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,749 - 2012 මාර්තු මස 09 වැනි සිකුරාදා - 2012.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 658 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 660 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 665 |

*සැ. යු.* - චන්දිම වීරක්කොඩි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ජනවාරි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

සෙයියිද් ෂේක් කෝයා තංගල් මවුලානා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ජනවාරි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ජනවාරි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මාර්තු මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## තංගල්ල ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ (පළාත් පාලන) පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

තංගල්ල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ට සහ තංගල්ල ප්‍රාදේශීය සභාවේ දැනටමත් තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුක්ත වූ අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| *අනු අංකය* | *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක | 01 | iii | PL-1-2006A කේත අංකය රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 | අටවන ශ්‍රේණිය (නව වන වසර) සමත් විය යුතුයි. |
| 02 | මුරකරු | 01 | iii | PL-1-2006A කේත අංකය රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 | අටවන ශ්‍රේණිය (නව වන වසර) සමත් විය යුතුයි. |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :-*

01. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
02. අයදුම්කරුවන් දකුණු පළාත තුළ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනකට වැඩි කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
03. අයදුම්කරු විශිෂ්ඨ චරිතයක් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතුයි.
04. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.
05. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .-*

01. සියලු තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. පත්වීම් දින සිට අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත්ව එම කාලය තුළ සිය රාජකාරි වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණයෙන් (අදාළ තනතුරු සඳහා) සමත්ව තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
03. ඒ ඒ තනතුරු වල බඳවා ගැනීමේ පරිපාටිවලට අමතරව, ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට සහ දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

04. *අයදුම්කළ යුතු පිළිවෙල :-*

01. මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘති ප්‍රකාරව ( A 4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන) පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, තංගල්ල ප්‍රාදේශීය සභාව, නෙටොල්පිටිය" යන ලිපිනයට 2012 මාර්තු 30 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.
02. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "............................................" තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර තිබිය යුතු ය.
03. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුයි.
04. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.
05. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල සහතික කළ පිටපත් එවිය යුතුයි. සහතිකවල මුල්පිටපත් පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුයි.
    (i) උප්පැන්න සහතිකය ;

(ii) අධ්‍යාපන සහතික ;
(iii) හැඳුනුම්පතේ පිටපත්;
(iv) ග්‍රාම නිලධාරි සහතිකය ;
(v) දැනට මෙම ආයතනයේ සේවය නියුතු අයගේ නම් සේවා සහතිකපත්;
(vi) තනතුරුවලට අදාල ශිල්පීය නිපුනතා/ප්‍රවීනතා සහතික ;
(vii) තනතුරුවලට අදාළ ශිල්පීය නිපුනතා/ප්‍රවීනතා සහතික ;
(viii) මෑතක දී ලබාගත් චරිත සහතික ;

ලාල් රත්නායක,
ලේකම්,
තංගල්ල ප්‍රාදේශීය සභාව,
නෙටොල්පිටිය.

2012 පෙබරවාරි මස 05 වැනි දින,
නෙටොල්පිටිය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***තංගල්ල ප්‍රාදේශීය සභාව***

*---------------තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම:————————,
02. මුලකුරු සමග නම:————————,
03. ස්ථිර ලිපිනය:————————,
04. උපන් දිනය: අවුරුද්ද:——————, මාසය:————, දිනය:—————,
05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු:———— , මාස :————, දින:———— ,
06. ස්ත්‍රී/පුරුෂ භාවය:————————,
07. විවාහක/අවිවාහක බව:————————,
08. ජාතිය/ආගම:————————,
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන් ද යන වග :————————,
10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය:————————,
11. අධ්‍යාපන සුදුසුකම්(සහතික පිටපත් අමුණා එවන්න):————————,
12. වෙනත් සුදුසුකම්:————————,
13. සේවා පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————,
14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්, එම සේවා කාලය සහ විස්තර, එම පත්වීමේ ස්වභාවය (තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) :————————,
15. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලබා උසාවියකින් වරදකරුවෙකු වී තිබේ ද ?

අනාවරණය වුවහොත්, නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දන්වමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————,

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*
*(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)*

අයදුම්කරුගේ ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරීමට එකඟවන බවත්, ................................................................................... වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය:————————.

03-350

# පළාත් පාලන නිවේදන

## කොටපොල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය ප්‍රකාරව කොටපොල ප්‍රාදේශීය සභාවේ පාරවල් සහ පටුමාවත්වල නාමලේඛනය පහත උපලේඛන අංක 01 මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින උපලේඛන අංක 01 හි විස්තර කෙරෙන පාර කොටපොල ප්‍රාදේශීය සභාව සතු පාර ලෙස සලකා සංවර්ධනය කිරීමට 2011.07.28 දින පැවති මහ සභාවේ තීරණ අංක 05.01 මගින් තීරණය කර ඇති බවත්, එකී පාර හෝ එම පාර පිහිටි ඉඩමක් සම්බන්ධයෙන් හිමිකම් පාන පාර්ශ්වයක් හෝ මෙම පාරවල් ප්‍රාදේශීය සභාව මගින් සංවර්ධනය කිරීමට යම් විරෝධතාවයක් දක්වන පාර්ශවයක් හෝ වෙතොත් මෙම දැන්වීම පළකරනු ලැබූ දින සිට මාස 03 ක් ගතවීමෙන් පසු මාස 06ක් ගත වීමට පෙර ඒ බව කොටපොල ප්‍රාදේශීය සභාව වෙත ලිඛිතව වාර්තා කරන ලෙසත්, එසේ එකී කාලය තුළ විරෝධතාවයක් හෝ හිමිකම් පෑමක් වාර්තා නොවන්නේ නම් එම පාර දන්වා ඇති ආකාරයෙන්ම කොටපොල ප්‍රාදේශීය සභාව සතු පාරක් සේ සලකා සංවර්ධන කටයුතු සිදුකරන බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

ඒ. පී. දයානන්ද,
සභාපති,
කොටපොල ප්‍රාදේශීය සභාව.

2012 පෙබරවාරි මස 13 වැනි දින,

| *අනු. අංකය* | *මාර්ගය* | *මාර්ගයේ ආරම්භක ලක්ෂ්‍යය* | *මාර්ගයේ අවසාන ලක්ෂ්‍යය* | *පාරේ දිග (කිලෝ මීටර්)* | *පාරේ පළල (මීටර්)* |
|---|---|---|---|---|---|
| 1 | පන්සල පාර සිට ගල්කුඹුර හේන්යාය මාර්ගය | දෙනියාය පන්සල පාරේ ජී. අනුර මහතාගේ නිවස අසල සිට | ගල්කුඹුර හේන්යාය මාර්ගය දක්වා | මීටර් 800 | අඩි 04 |

03-289

---

## කොළඹ මහ නගර සභාව

ගෝසාතක ආඥාපනත (272 වැනි පරිච්ඡේදය)

මතු සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් එකී නම ඉදිරියෙන් විස්තර දක්වා ඇති ස්ථානයන්හි 2012 වර්ෂය තුළ මස්කඩ පවත්වාගෙන යාම පිණිස ගෝසාතක බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කොළඹ මහ නගර සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය පිටපත් දෙකකින් යුත් සවිස්තර ලියවිල්ලක් වශයෙන් සකස් කර මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවී දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, ගෝසාතක ආඥාපනතේ (272) වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

අහමඩ් ජමල්ඩීන් මොහොමඩ් මුසම්මිල්,
නගරාධිපති,
කොළඹ මහ නගර සභාව.

2012 පෙබරවාරි මස 17 වැනි දින.
නගර ශාලාව,
කොළඹ 07.

### උපලේඛන අංක 01

*මැනිං පොදු වෙළඳපොල*

| *අනු. අංකය* | *ටෙන්ඩර්කරුගේ නම* | *කඩ අංකය* | *වෙළඳ ස්වභාවය* |
|---|---|---|---|
| 1. | දෙල්ගහවත්ත සත්ව ගොවිපල පුද්ගලික සමාගම | 821 | ඌරු මස් |
| 2. | එන්. එම්. එම්. යුනූෆ් | 824 | ගව මස් |
| 3. | කේ. එස්. ප්‍රනාන්දු | 825 | එළු මස් |
| 4. | එම්. එච්. ෂාමන් | 826 | ගව මස් |
| 5. | එෆ්. සාමිලා සීනි | 827 | ගව මස් |
| 6. | අසීස් සහ පුත්‍රයෝ පුද්ගලික සමාගම | 828 | ගව මස් |
| 7. | අයි. ආර්. එම්. අස්රෆ් | 829 | ගව මස් |
| 8. | ජී. රාජනාදන් | 830 | ගව මස් |
| 9. | ජී. රවින්ද්‍රනාදන් | 832 | එළු මස් |

| අනු. අංකය | ටෙන්ඩර්කරුගේ නම | කඩ අංකය | වෙළඳ ස්වභාවය |
|---|---|---|---|
| *බොරැල්ල පොදු වෙළඳ සංකීර්ණය* | | | |
| 10. | ඕ. එච්. එච්. නජිමුඩීන් | 7බී/26 | ගව මස් |
| 11. | එච්. බී. එෆ්. හිනායා | 7බී/29 | ගව මස් |
| 12. | එස්. ඕමර් කත්තා | 7බී/30 | ගව මස් |
| 13. | ජී. එස්. එම්. ඒ. රාසික් | 7බී/31 | එළු මස් |
| 14. | ඒ. එස්. මොහොමඩ් | 7බී/35 | ගව මස් |
| 15. | එස්. ඕමර් කත්තා | 7බී/37 | ගව මස් |
| 16. | බී. කේ. නිසා බේගම් | 7බී/41 | ගව මස් |
| 17. | ඕ. එච්. එච්. නජිමුඩීන් | 7බී/42 | ගව මස් |
| 18. | එස්. එච්. එන්. රහීම් | 7බී/43 | එළු මස් |
| 19. | ආර්. ඒ. සී. ද අල්විස් | 7බී/55 | ඌරු මස් |
| *දෙමටගොඩ පොදු වෙළඳපොල* | | | |
| 20. | මොහමඩ් අෂ්රෆ් ඛාන් | 08 | ගව මස් |
| *ඩීන්ස් පාර පොදු වෙළඳපොල* | | | |
| 21. | එම්. වයි. ඕ. එම්. ඉක්බාල් | 44/03 | ගව මස් |
| 22. | එම්. එන්. එච්. ෂනාස් | 44/05 | ගව මස් |
| 23. | එස්. එච්. ඉම්තියාස් | 44/06 | ගව මස් |
| 24. | ඒ. එම්. ෂෙරිෆ්ඩීන් | 44/07 | එළු මස් |
| 25. | එම්. එස්. එම්. ඉක්බාල් | 44/08 | ගව මස් |
| 26. | එන්. එම්. එම්. රෆීක් | 44/09 | ගව මස් |
| 27. | එම්. ඕ. ඒ. කාදර් | 44/10 | ගව මස් |
| 28. | එම්. එම්. ඩිල්ෂාර් | 44/11 | එළු මස් |
| *කොල්ලුපිටිය පොදු වෙළඳපොල* | | | |
| 29. | දෙල්ගහවත්ත සත්ව ගොවිපල පුද්ගලික සමාගම | 01ඒ | ඌරු මස් |
| 30. | එම්. රිෆ්කාන් | 03 | එළු මස් |
| 31. | එම්. මුසම්මිල් | 04 | ගව මස් |
| 32. | එම්. එස්. එම්. අස්වර් | 09 | එළු මස් |
| 33. | එම්. මව්ලාන් | 10 | ගව මස් |
| 34. | ඒ. ආර්. එම්. සරූක් | 11 | එළු මස් |
| 35. | මොහමඩ් සෆ්රාස් | 12 | ගව මස් |
| *බම්බලපිටිය පොදු වෙළඳපොල* | | | |
| 36. | එන්. එම්. එස්. ඩාවුඩ් | 21 | ගව මස් |
| 37. | එස්. සයිෂාන් | 22 | ගව මස් |
| 38. | එන්. කේ. එම්. නිහාර් | 23 | එළු මස් |
| 39. | එස්. ඕ. එම්. රියාල් | 25 | ගව මස් |
| *වැල්ලවත්ත පොදු වෙළඳපොල* | | | |
| 40. | දෙල්ගහවත්ත සත්ව ගොවිපල පුද්ගලික සමාගම | 01 | ඌරු මස් |
| 41. | ඒ. සී. එන්. මොහොමඩ් | 01 | ගව මස් |
| 42. | ආර්. එම්. මොහිදීන් | 02 | ගව මස් |
| 43. | එච්. එම්. ඒ. ඛාන් | 03 | ගව මස් |
| 44. | එම්. එච්. මොහමඩ් ෆසාල් | 04 | ගව මස් |
| 45. | කේ. බී. එම්. ෆසූල් | 01 | එළු මස් |
| 46. | එම්. ෆාරූක් මොහමඩ් | 02 | එළු මස් |
| 47. | එන්. එම්. එම්. යූසුෆ් | 03 | එළු මස් |

| අනු. අංකය | ටෙන්ඩර්කරුගේ නම | කඩ අංකය | වෙළඳ ස්වභාවය |
|---|---|---|---|
| *මාලිගාවත්ත පොදු වෙළඳපොල* | | | |
| 48. | එන්. එම්. එම්. මුස්තකීන් | 02 | එළු මස් |
| 49. | එම්. එෆ්. එම්. සිතීක් | 04 | ගව මස් |
| 50. | එම්. ඒ. එන්. සෆ්රාස් | 05 | ගව මස් |
| 51. | එච්. එම්. එම්. සුහයිල් | 06 | ගව මස් |
| 52. | එන්. එම්. එම්. බුර්හාන් | 07 | ගව මස් |
| 53. | ජේ. ඩී. එම්. යූෂුෆ් | 08 | ගව මස් |
| 54. | එච්. එම්. එම්. සුහයිල් | 09 | ගව මස් |
| *කොටහේන පොදු වෙළඳපොල* | | | |
| 55. | අයි. එච්. බී. එස්. තුල්කර්නි | 11 | ගව මස් |
| 56. | අයි. එච්. එච්. සිද්දික් | 13 | ගව මස් |
| 57. | එම්. එෆ්. එම්. රිෆාස් | 14 | එළු මස් |
| 58. | එම්. එච්. එම්. ෂරීෆා | 17 | එළු මස් |
| *ජාතික පොල වෙළඳපොල* | | | |
| 59. | මොහමඩ් රූමි | 275 | ගව මස් |
| 60. | අබ්දුල් රහුමාන් | 277 | එළු මස් |
| *කොස්ගස්හන්දිය පොදු වෙළඳපොල* | | | |
| 61. | එස්. ඕ. අබ්දුල් සමාඩ් | 10/08 | ගව මස් |
| 62. | ඒ. එස්. එම්. බිෂ්රුල් නසාර් | 10/09 | ගව මස් |
| 63. | ඒ. කේ. ෂාවුල් හමීඩ් | 10/10 | එළු මස් |
| 64. | ජේ. ඒ. මොහමඩ් රිල්වාන් | 10/12 | ගව මස් |
| *ජින්තුපිටිය පොදු වෙළඳපොල* | | | |
| 65. | ඒ. බී. එම්. තාජුඩීන් | 01 | එළු මස් |
| 66. | ඒ. බී. එම්. තාජුඩීන් | 03 | ගව මස් |
| 67. | බී. ප්‍රනාන්දු | 07 | එළු මස් |
| *විස්ට්වයික් පොදු වෙළඳපොල* | | | |
| 68. | එම්. තන්සිල් | 12 | ගව මස් |
| 69. | එච්. එම්. එම්. උමර්ඩීන් | 13 | එළු මස් |
| 70. | එම්. නජුර්ඩීන් | 14 | ගව මස් |
| *නාගලම්වීදිය පොදු වෙළඳපොල* | | | |
| 71. | ඒ. ආර්. එම්. ඩී. මොහිදීන් ඛාන් | 375/1 | එළු මස් |
| 72. | ඒ. ආර්. එම්. අලිඛාන් | 375/3 | ගව මස් |
| 73. | ඒ. ආර්. එම්. හජ්මීර් ඛාන් | 375/4 | ගව මස් |
| 74. | ඒ. ආර්. එම්. අලිඛාන් | 375/5 | ගව මස් |
| *මෝදර පොදු වෙළඳපොල* | | | |
| 75. | ඒ. ආර්. එම්. අලිඛාන් | 04 | ගව මස් |
| *කිරුළපන පොදු වෙළඳපොල* | | | |
| 76. | ආර්. ඒ. සී. ද අල්විස් | 103 | ඌරු මස් |
| 77. | එෆ්. අයුබ්කාන් | 147 | එළු මස් |
| 78. | ජේ. ඒ. එස්. කබීර් | 148 | ගව මස් |
| 79. | එස්. එම්. එන්. මොහොමඩ් | 149 | ගව මස් |
| 80. | බී. ඉසෙඩ්. මොහොමඩ් ෂා | 150 | ගව මස් |
| *කොම්පඤ්ඤ වීදිය පොදු වෙළඳපොල* | | | |
| 81. | එස්. නිහාර්ඩීන් | 01 | එළු මස් |
| 82. | එම්. එන්. කාසීම් | 02 | ගව මස් |
| 83. | කේ. එම්. ෆවුස්ඩීන් | 03 | ගව මස් |
| 84. | එස්. එම්. තාවුස් | 04 | ගව මස් |

*පෞද්ගලික මස් කඩ*

*පුද්ගලික ගව මස් වෙළඳසැල්*

| *අනු අංකය* | *නම* | *ස්ථානය* |
|---|---|---|
| 1. | එම්. එච්. එම්. නිලාම් මයා | අංක 324, දෙමටගොඩ පාර, කොළඹ 09. |
| 2. | එස්. කේ. කාදර් මයා | අංක 07, ද මැල් වීදිය, කොළඹ 02. |
| 3. | ජේ. ජේ. ජමාල් මයා | අංක 07ඒ, ද මැල්වීදිය, කොළඹ 02. |
| 4. | එස්. නිහාර්ඩීන් මයා | අංක 07බී, ද මැල් වීදිය, කොළඹ 02. |
| 5. | මර්ලින් කීගල් මිය | අංක 102, ශාන්ත අන්තෝනි පාර, කොළඹ 13. |
| 6. | එස්. මොහොමඩ් රාෆික් මයා | අංක 45, මැසෙන්ජර් වීදිය, කොළඹ 12. |
| 7. | ඒ. ආර්. එම්. අලිඛාන් මයා | අංක 427, මාදම්පිටිය පාර, කොළඹ 14. |
| 8. | එම්. එෆ්. ජෙයිනුල් ආබ්දීන් මයා | අංක 97, අබ්දුල් හමීඩ් වීදිය, කොළඹ 12. |
| 9. | ටී. කේ. එන්. ෆරීනා මිය | අංක 211/52, ජුම්මා මස්ජිඩ් පාර, කොළඹ 10. |
| 10. | ජී. එස්. එච්. අබ්දුල් මජීඩ් මයා | අංක 01, හුසේනියා වීදිය, කොළඹ 12. |
| 11. | එම්. එම්. එම්. ෂබ්රි මයා | අංක 227, ලෙයාඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ 14. |
| 12. | එම්. ආර්. එම්. රම්ලි මයා | අංක 195, මිරානියා වීදිය, කොළඹ 12. |
| 13. | එම්. ටී. ආර්. අමීර් මයා | අංක 111/2, මධ්‍යම පාර, පිටකොටුව. |
| 14. | එස්. එම්. ෂුක්රි මයා | අංක 226, මොහිදීන් මස්ජිඩ් පාර, කොළඹ 10. |
| 15. | ඒ. එම්. ෂාහුල් හමීඩ් මයා | අංක ඒ. ජී. 05, විතානගේ මාවත, කොළඹ 02. |

*පෞද්ගලික ගව/එළු/ඌරු මස් වෙළඳසැල්*

| | | |
|---|---|---|
| 16. | කාගීල්ස් ලංකා සමාගම | අංක 40, යෝක් වීදිය, කොළඹ 01. |

03-398

---

**හබරාදූව ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාවත හබරාදූව ප්‍රාදේශීය සභාව සතු මාවතක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මාවතට අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධතාවයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්ති ප්‍රකාර ක්‍රියාකරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය හබරාදූව ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් පිලිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2012 මාර්තු මස 09 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | | |
|---|---|---|
| පාරේ නම | - | අහංගම, නන්දිපාල ඉපලවත්ත මාර්ගය |
| ආරම්භය | - | ගාල්ල මාතර පාර |
| අවසානය | - | දොම්මන්නගොඩ මාර්ගය |
| පාරේ දිග | - | මීටර් 372 |
| පාරේ පළල | - | මීටර් 3.03 |
| ග්‍රාම සේවා වසම | - | 160ඒ දොම්මන්නගොඩ |

*වම්පස :*

| | | | |
|---|---|---|---|
| 01. | ඒ. වී. ගාමිණී මයා | - | පත්තිනිගෙවත්ත |
| 02. | බී. ඩබ්. ඒ. සෝමවතී මිය | - | පත්තිනිගෙවත්ත |
| 03. | එම්. පී. ජී. සංඝදාස මයා | - | පත්තිනිගෙවත්ත |
| 04. | එච්. ආර්. බන්දුල මයා | - | පත්තිනිගෙවත්ත |
| 05. | එච්. ආර්. සේනානන්ද මයා | - | මහදෙනියවත්ත |
| 06. | ඩබ්. සුමනදාස මයා | - | මහදෙනියවත්ත |
| 07. | අජන්ත උදයකුමාර මයා | - | මහදෙනියවත්ත |
| 08. | දිස්නා වල්ගම මිය | - | මහදෙනියවත්ත |
| 09. | ඩෙව්රියස් ඉපලවත්ත මයා /ඊබට් ඉපලවත්ත මයා | - | කන්කානිගෙවත්ත |
| 10. | එච්. ආර්. සුමනසිරි මයා | - | තල්ගහවත්ත |

*දකුණුපස :*

| | | | |
|---|---|---|---|
| 01. | ඉන්ධන පිරවුම්හල | - | ගජනායකවත්ත |
| 02. | ඩබ්. සුමනාවතී මිය | - | ගජනායකවත්ත |
| 03. | ටී. ඩබ්. පද්මසිරි මයා | - | ගජනායකවත්ත |
| 04. | එස්. සෝමරත්න ද සිල්වා මයා | - | ගජනායකවත්ත |

| | | | |
|---|---|---|---|
| 05. | ඩෙව්රියස් ඉපලවත්ත මයා. /ඊබට් පහලවත්ත මයා. | - | අරඹවත්ත දෙනිය |
| 06. | ඩී. කේ. පියදාස මයා. | - | මහමදින්නවත්ත |
| 07. | වාසනා සඳමාලි මිය. | - | ගමගෙවත්ත |
| 08. | එච්. ඩී. සී. චන්ද්‍රලතා මිය. | - | ගමගෙවත්ත |
| 09. | ඩබ්. එම්. ආර්. සෝමකුමාර මයා. | - | ජුල්ගහකොරටුව |
| 10. | ආර්. කමලානි තංගනී මිය. | - | ජුල්ගහකොරටුව |
| 11. | හවුල් ඉඩමක්. | - | දෙමළකන්දවත්ත |

03-296

---

**පන්නල ප්‍රාදේශීය සභාව**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පන්නල ප්‍රාදේශීය සභාව විසින් 2011.06.28 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එම්. එස්. කේ. රංජිත් ලංසකාර,
සභාපති,
පන්නල ප්‍රාදේශීය සභාව.

2012 පෙබරවාරි මස 10 වැනි දින

*යෝජනාව :*

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තිය යටතේ වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 දින අංක 1663 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළ කරනු ලැබූ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 අංක 1703/18 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද ප්‍රාදේශීය සභා වල අප්‍රසන්න, අන්තරායදායක හා අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු, සංචාරක වෙළඳාම, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම, ලැගුම් නිවාස හා නවාතැන්පළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ පන්නල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

03-531

---

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 92-2011 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 25 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ යුක්තිසහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක, එවැනි යම් ඉඩමක —

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් ; හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක ; හෝ

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2012 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම දෙකක (0.2%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2012 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි විධාන කිරීමටත් නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.''

03-526/3

---

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 92-2011 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක්ම තුළ දී සමාන වාරික හතරකින් නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2012 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%.) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 25 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***යෝජනාව***

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (I) වගන්තිය ප්‍රකාර, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙපත්වල වාර්ෂික තක්සේරු වටිනාකම් වශයෙන් නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂය සඳහා පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම් 2012 වර්ෂය සඳහා නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් කරන ලද තක්සේරු වටිනාකම් වශයෙන් පිළිගැනීමටත්, එකී ප්‍රාදේශීය සභා ආඥාපනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් -

(අ) හිස් ඉඩම් සහ නේවාසික ස්ථාන මත සියයට පහළොවක (15%) වරිපනමක් ද සහ ;
(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට පහළොව (15%) ක වරිපනමක් ද ;

2012 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා ආඥාපනතේ 134(1) (6) වැනි වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනි දිනවලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ගෙවීමට විධාන කිරීමටත් නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.''

03-526/2

---

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 92-2011 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 25 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***යෝජනාව***

''1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් කෙටුම්පත් කර 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරනු ලැබූ සහ උතුරුමැද පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බවට 1992 පෙබරවාරි මස 28 වැනි දින අංක 704IV(ආ) දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාව, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* 1993.12.10 දින අංක 797IVකොටසේ පළකර වැළඳගත් බවත්, එසේ පිළිගත් සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බවත් ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.''

03-526/1

---

# විවිධ දැන්වීම්

**ගිරිබාව ප්‍රාදේශීය සභාව**

පරිසර බලපත්‍ර ගාස්තු - 2012 වර්ෂය

1990 අංක 12 දරන වයඹ පළාත් පරිසර ප්‍රඥප්තියෙහි 11 වැනි කොටසේ 10(1) වැනි වගන්ති ප්‍රකාරව සහ 1987 අංක 13 දරන ප්‍රාදේශීය සභා පනතේ 106 වැනි වගන්තිය ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව පහත අංක 01 උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර හෝ කර්මාන්ත සඳහා

අංක 02 උපලේඛනයේ සඳහන් ආකාරයට ඒ ඒ ව්‍යාපාර හෝ කර්මාන්තයන්හි ආයෝජන මුදලට සාපේක්ෂව පරීක්ෂණ ගාස්තුවක් සහ බලපත්‍ර ගාස්තුවක් 2012 වර්ෂය සඳහා පනවා අයකිරීමට ගිරිබාව ප්‍රාදේශීය සභාව තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

ඊ. එම්. ආනන්ද රූපසිංහ,
සභාපති,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2011 ඔක්තෝබර් මස 19 වැනි දින,
තඹුත්ත, ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*අංක 01 උපලේඛනය*

01. ලී මෝල්,
02. වී මෝල්,
03. කළුගල් වැඩපළවල්,
04. බේකරි,
05. දැව ඉරුම්හල්,
06. සත්ත්ව ගොවිපලවල්,
07. ගඩොල් කර්මාන්ත,
08. වෙල්ඩින් වැඩපලවල්,
09. මෝටර් ගරාජ්,
10. සහල් සැකසුම් මධ්‍යස්ථාන,
11. පොල්ලෙලි ආශ්‍රිත කර්මාන්ත,
12. වාහන සේවා ස්ථානය,

*අංක 02 උපලේඛනය*

| *ආයෝජන මුදල* | *පරීක්ෂණ ගාස්තුව රු. ශත* | *පරිසර බලපත්‍ර ගාස්තුව රු. ශත* |
|---|---|---|
| (01) රු. 2,00,000 දක්වා | 250 0 | 750 0 |
| (02) රු. 2,00,000 සිට 5,00,000 දක්වා | 500 0 | 750 0 |
| (03) රු. 5,00,000 සිට 10,00,000 දක්වා | 1,250 0 | 750 0 |
| (04) රු. 10,00,000 ට වැඩි | 2,500 0 | 750 0 |

03-475/6

---

## ගිරිබාව ප්‍රාදේශීය සභාව

### වෙනත් ගාස්තු පැනවීම - 2012 වර්ෂය

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | වීථි රේඛා සහතික ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 30 0 |
| 02. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 200 0 |
| 03. | පරිසර බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 100 0 |
| 04. | පරිසර අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 50 0 |
| 05. | වීථි රේඛා සහතික ගාස්තුව | 600 0 |
| 06. | *ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ පෙරසැරි ගාස්තු :* | |
| | වර්ග අඩි 500ට අඩු | 500 0 |
| | වර්ග අඩි 500ත් 1,000ත් අතර, | 750 0 |
| | වර්ග අඩි 1,000ට වැඩි | . 1,000 0 |
| 07. | ඡායා පිටපත් ගාස්තු - ඒ-4 එක පිටුවක් සඳහා | 10 0 |
| 08. | ඡායා පිටපත් ගාස්තු - ඒ-3 එක පිටුවක් සඳහා | 15 0 |
| 09. | ජලය බවුසර 01ක් සැපයීම සඳහා | 850 0 |
| 10. | ජල බවුසරය පමණක් වරුවක් හෝ ඉන් කොටසක් සඳහා තබා ගැනීම | 2,000 0 |
| 11. | ට්‍රැක්ටරය, ජල බවුසරය, ජල මෝටරය සමග එක් දිනක් සඳහා | 4,000 0 |

අංක 9,10,11 සඳහා ප්‍රවාහන ගාස්තු වශයෙන් පළමු කිලෝමීටරය හෝ ඉන් කොටසකට රු. 300ක් ද වැඩිවන කිලෝමීටරයක් සඳහාම රු. 75 බැගින් අයකරනු ලැබේ. ඉහත 11,12 සඳහා ජල මෝටරයට අවශ්‍ය ඉන්ධන සේවය ඉල්ලා සිටින අය විසින් දැරිය යුතුය.

| | | *රු. ශ.* |
|---|---|---|
| 12. | ට්‍රැක්ටරය කුලියට දීම (එක් දිනක් සඳහා) | 3,900 0 |
| 13. | ට්‍රැක්ටරය කුලියට දීම (දින 1/2ක් සඳහා) (වරුවක්) | 2,000 0 |
| 14. | ට්‍රැක්ටරය සහ ගල්රෝල කුලියට දීම දිනකට | 3,900 0 |
| 15. | ට්‍රැක්ටරය සමග ගල් රෝල කුලියට දීම (දින 1/2ක්) (වරුවක්) | 2,000 0 |

මෙම ගාස්තු සඳහා රජය විසින් කලින් කලට පනවනු ලබන බදු ඇතුළත් කිරීමට සිදුවනු ඇත.

ඊ. එම්. ආනන්ද රූපසිංහ,
සභාපති,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2011 ඔක්තෝබර් මස 19 වැනි දින,
තඹුත්ත.
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-475/7

---

## ගිරිබාව ප්‍රාදේශීය සභාව

### ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් බදු පැනවීම - 2012 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය ප්‍රකාර අංක 03 උපලේඛනයේ සඳහන් ව්‍යාපාර සහ වෘත්තීන් සඳහා පහත සඳහන් ආකාරයට පෙර වර්ෂයේ ඒ ඒ ව්‍යාපාරවල ලැබීම්වලට අනුව 2012 වර්ෂය සඳහා බද්දක් පනවා අය කිරීමට ගිරිබාව ප්‍රදේශීය සභාව තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

ඊ. එම්. ආනන්ද රූපසිංහ,
සභාපති,
ගිරිබාව ප්‍රාදේශීය සභාව,
තඹුත්ත.

2011 ඔක්තෝබර් මස 19 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | *ව්‍යාපාරයේ වාර්ෂික ආදායම* | *ගෙවිය යුතු බද්ද රු. ශ.* |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන එහෙත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| 6. | රු. 150,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

### උපලේඛන අංක 03

01. කොමිස් ඒජන්තවරු
02. වෙන්දේසිකරුවන්
03. බ්‍රෝකර්වරුන්
04. මුදල් ආයෝජකයින්
05. උකස් බඩු ගන්නන්
06. කොන්ත්‍රාත්කරුවන්
07. සැපයුම්කරුවන්
08. දිස්ත්‍රික් ලොතරැයි අලෙවි නියෝජිතයින්
09. රක්ෂණ සේවා ස්ථාන
10. මෝටර් රථ හා බර වාහන අලෙවිකරුවන්
11. පෞද්ගලික පාසැල්
12. රැකියා ඒජන්තවරු
13. බැංකු
14. ගෘහ නිර්මාණ හා සැලසුම් ශිල්පීන්
15. තක්සේරුකරුවන්
16. පෞද්ගලික වෛද්‍ය ස්ථාන පවත්වාගෙන යන වෛද්‍යවරුන්
17. නීතිඥයින්
18. ඇඟලුම් කම්හල්
19. මත්පැන් අලෙවිසැල්
20. දේපල වෙළඳාම් ආයතන

03-475/3

---

### ගිරිබාව ප්‍රාදේශීය සභාව

#### ප්‍රචාරක දැන්වීම් ගාස්තු - 2012 වර්ෂය

1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කරන ලද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය ප්‍රකාර බලය ලැබී ඇති පරිදි ගිරිබාව ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වැනි කොටසේ දෘෂ්‍ය පරිසරය/ප්‍රචාරක දැන්වීම් අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට ප්‍රචාරක දැන්වීම් ගාස්තු 2012 වර්ෂය සඳහා පනවා අය කිරීමට ගිරිබාව ප්‍රාදේශීය සභාව තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

ඊ. එම්. ආනන්ද රූපසිංහ,
සභාපති,
ගිරිබාව ප්‍රාදේශීය සභාව,
තඹුත්තේ.

2011 ඔක්තෝබර් මස 19 වෙනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | රු. ශත |
|---|---|---|
| 01. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට (වර්ෂයකට) | 60 0 |
| 02. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 01කට අඩු කාලයක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට | 20 0 |
| 03. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 01කට නොඅඩු සහ මාස 03කට නොවැඩි කාලයක් සඳහා වර්ග අඩියකට | 30 0 |
| 04. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 03කට නොඅඩු සහ මාස 06කට නොවැඩි කාලයක් සඳහා වර්ග අඩියකට | 40 0 |
| 05. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 06කට නොඅඩු සහ වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා වර්ග අඩියකට | 50 0 |

03-475/4

---

### ගිරිබාව ප්‍රාදේශීය සභාව

#### ව්‍යාපාර හා කර්මාන්ත බදු පැනවීම - 2012 වර්ෂය

1980 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 150 වගන්තිය ප්‍රකාර ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන උපලේඛන අංක 02 හි දක්වා ඇති ව්‍යාපාර හෝ කර්මාන්ත සඳහා 2012 වර්ෂය වෙනුවෙන් එම උපලේඛනයේ සඳහන් පරිදි බද්දක් පනවා අයකිරීමට ගිරිබාව ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඊ. එම්. ආනන්ද රූපසිංහ,
සභාපති,
ගිරිබාව ප්‍රාදේශීය සභාව,
තඹුත්තේ.

2011 ඔක්තෝබර් මස 19 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය අංක 02

*වෙළඳ ව්‍යාපාරය*

| | | *වාර්ෂික වටිනාකම රු. 750 නොවැඩි* | *වාර්ෂික වටිනාකම රු. 750 ත් රු. 1,500 අතර* | *වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි* |
|---|---|---|---|---|
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | සිල්ලර වෙළඳ සැලක් | 300 0 | 400 0 | 500 0 |
| 02. | ඇඳුම් මැසීමේ මධ්‍යස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 03. | විසිතුරු බඩු අලෙවි කිරීම | 300 0 | 400 0 | 500 0 |

| වෙළඳ ව්‍යාපාරය | වාර්ෂික වටිනාකම රු. 750 නොවැඩි රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 750 ත් රු. 1,500 අතර රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු. ශ. |
|---|---|---|---|
| 04. රියදුරු පුහුණු ආයතනයක් | 400 0 | 500 0 | 600 0 |
| 05. කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවි කිරීම | 400 0 | 500 0 | 600 0 |
| 06. උළු සහ ගඩොල් අලෙවි සැලක් | 400 0 | 500 0 | 600 0 |
| 07. සාප්පු බඩු අලෙවි කිරීම | 300 0 | 400 0 | 500 0 |
| 08. එළවලු අලෙවි කිරීම | 300 0 | 400 0 | 500 0 |
| 09. ඉංග්‍රීසි බෙහෙත් අලෙවි සැලක් | 400 0 | 500 0 | 600 0 |
| 10. වාහන අමතර කොටස් අලෙවි කිරීම | 400 0 | 500 0 | 600 0 |
| 11. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 12. ගෘහ භාණ්ඩ අලෙවිසැලක් | 300 0 | 400 0 | 500 0 |
| 13. විදුලි උපකරණ අලෙවි කිරීම | 400 0 | 500 0 | 600 0 |
| 14. ධාන්‍ය මිලදී ගැනීම හා අලෙවි කිරීම | 500 0 | 600 0 | 700 0 |
| 15. මල්ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 16. පාවහන් වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 17. පාපැදි හා යතුරු පැදි අලෙවිසැලක් | 400 0 | 500 0 | 600 0 |
| 18. අත්ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් අලෙවි කිරීම | 400 0 | 500 0 | 600 0 |
| 19. ලොතරැයි අලෙවි සැලක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 20. පොත් හා ලිපිද්‍රව්‍ය අලෙවිසැලක් | 300 0 | 400 0 | 500 0 |
| 21. සිංහල බෙහෙත් අලෙවි සැලක් | 300 0 | 400 0 | 500 0 |
| 22. පින්තූර රාමු කරන ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 23. සුරතල් මසුන් අලෙවි කිරීම | 300 0 | 400 0 | 500 0 |
| 24. කොමියුනිකේෂන් එකක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 25. දැන්වීම් පුවරු, බැනර්, කටවුට්, පෝස්ටර් ඇඳීම | 300 0 | 400 0 | 500 0 |
| 26. තැඹිලි, කුරුම්බා අලෙවි කිරීමේ ස්ථානයක් | 200 0 | 300 0 | 400 0 |
| 27. ඇස් කණ්නාඩි අලෙවි කිරීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 28. තේ කොළ අලෙවි කිරීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 29. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 30. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් | 400 0 | 500 0 | 600 0 |
| 31. සී. ඩී. කැසට් පට අලෙවි කිරීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 32. කැලි රෙදි අලෙවි කිරීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 33. වීදුරු හා ප්ලාස්ටික් බඩු අලෙවි කිරීම | 300 0 | 400 0 | 500 0 |
| 34. පුවත්පත් අලෙවි කිරීමේ ස්ථානයක් | 200 0 | 300 0 | 400 0 |
| 35. පැරණි භාණ්ඩ එකතු කිරීමේ ස්ථානයක් | 200 0 | 300 0 | 400 0 |
| 36. උකස් බඩු ගන්නා ස්ථානයක් | 400 0 | 500 0 | 600 0 |
| 37. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 38. ටයර් සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 39. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 40. ඡායා පිටපත් හා ටයිප් සෙටින් ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 41. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 42. වැලි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 1,000 0 |
| 43. රූපලාවන්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 44. ජුවලරියක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 45. මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 46. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 47. පැල අලෙවි කිරීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 48. වාහන සහ යන්ත්‍ර සූත්‍ර කුලියට දීම | 500 0 | 600 0 | 700 0 |
| 49. සමුපකාර සිල්ලර වෙළඳ සැල් | 300 0 | 400 0 | 500 0 |
| 50. සෙල්ලම් බඩු අලෙවි සැලක් | 300 0 | 400 0 | 500 0 |
| 51. උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 52. සූර්යවාහිනී අලෙවි කිරීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 600 0 |
| 53. ඉන්ධන අලෙවි කිරීමේ ස්ථානයක් | 500 0 | 700 0 | 900 0 |
| 54. බුලත්, පුවක්, දුම්කොළ අලෙවි කිරීම | 200 0 | 300 0 | 400 0 |

| වෙළඳ ව්‍යාපාරය | වාර්ෂික වටිනාකම රු. 750 නොවැඩි | වාර්ෂික වටිනාකම රු. 750 ත් රු. 1,500 අතර | වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 55. කෙසෙල් අලෙවි කිරීමේ ස්ථානයක් | 200 0 | 300 0 | 400 0 |
| 56. කෘතිම මල් අලෙවි සැලක් | 200 0 | 300 0 | 400 0 |
| 57. මල්පැල අලෙවි සැලක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 58. විදුලි භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 59. හඳුන්කූරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් | 150 0 | 250 0 | 350 0 |
| 60. දැව ගබඩාවක් හෝ අලෙවි සැලක් | 300 0 | 400 0 | 500 0 |
| 61. තොග වශයෙන් පොල් එකතු කිරීම | 400 0 | 500 0 | 600 0 |
| 62. දුරකථන අලෙවි සැලක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 63. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම | 300 0 | 400 0 | 500 0 |
| 64. පරිගණක පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 900 0 |
| 65. පළතුරු අලෙවි කිරීම | 300 0 | 400 0 | 500 0 |
| 66. පොල් මිලදී ගැනීම සහ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 67. හාඩ්වෙයාර් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. මංගල සේවා සැපයීමේ ආයතනයක් | 300 0 | 400 0 | 500 0 |
| 69. පැල තවානක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |

03-475/2

---

## ගිරිබාව ප්‍රාදේශීය සභාව

### වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම - 2012 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 වැනි වගන්තිය යටතේ ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන උපලේඛන අංක 01 හි දක්වා ඇති ව්‍යාපාර හෝ කර්මාන්ත සඳහා 2012 වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍රයක් ලබාගත යුතු බවත්, එම ව්‍යාපාර හෝ කර්මාන්තයන් වාර්ෂික වටිනාකම මත එම උපලේඛනයේ දක්වා ඇති ආකාරයට බලපත්‍ර ගාස්තුවක් අයකිරීමටත්, එම බලපත්‍රය 2012 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ලබාගත යුතු බවටත්, ගිරිබාව ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ සඳහා රජය විසින් කලින් කලට පනවන බදු මුදල් ගෙවිය යුතුයි.

ඊ. එම්. ආනන්ද රූපසිංහ
සභාපති,
ගිරිබාව ප්‍රාදේශීය සභාව,
තඹුත්තේ.

2011 ඔක්තෝබර් මස 19 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය අංක 01

| බලපත්‍රය අදාළ ව්‍යාපාරය | වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි | වාර්ෂික වටිනාකම රු. 750 ත් රු. 1,500 අතර | වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 01. තේ කඩයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 02. ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 03. කලුගල් වැඩපළක් පවත්වාගෙන යාම | 400 0 | 700 0 | 1,000 0 |
| 04. බේකරියක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 05. ආහාරපාන සහ නවාතැන් පහසුකම් | 500 0 | 750 0 | 1,000 0 |
| 06. ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |

*වෙළඳ ව්‍යාපාරය*

| | | *වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු* | *වාර්ෂික වටිනාකම රු. 750 ත් රු. 1,500 අතර* | *වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි* |
|---|---|---|---|---|
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 07. | සත්ව ගොවිපළක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 08. | කිරි ආශ්‍රිත නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 09. | රස කැවිලි නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 600 0 |
| 10. | මාළු වෙළඳාම් කිරීම | 400 0 | 500 0 | 600 0 |
| 11. | මස් අලෙවි කිරීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 600 0 |
| 12. | අයිස් ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 13. | කම්හලක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 14. | වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 600 0 |
| 15. | පා පැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 200 0 | 300 0 | 400 0 |
| 16. | බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 450 0 |
| 17. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීම | 300 0 | 400 0 | 500 0 |
| 18. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 19. | වී මෝලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |
| 20. | සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය | 300 0 | 400 0 | 500 0 |
| 21. | බත් කඩයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 22. | සංචාරක වෙළඳාම (මාළු) | 200 0 | 300 0 | 400 0 |
| 23. | සංචාරක වෙළඳාම (වෙනත්) | 300 0 | 400 0 | 500 0 |
| 24. | අයිස් ක්‍රීම් වෙළඳාම | 300 0 | 400 0 | 500 0 |
| 25. | ධාන්‍ය ඇඹරීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 26. | තෙල් මෝලක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 27. | බිම් මල් නිෂ්පාදනය හා අලෙවිය | 300 0 | 400 0 | 500 0 |
| 28. | ධාන්‍ය හෝ කුළු බඩු පැකට් කිරීම | 300 0 | 400 0 | 500 0 |
| 29. | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් | 300 0 | 400 0 | 500 0 |
| 30. | වෙල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 31. | අඟුරු නිෂ්පාදන ආයතනයක් | 400 0 | 500 0 | 600 0 |
| 32. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 33. | රෙකෝඩ්බාර් එකක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 34. | ශීතකරණ හා වායුසමීකරණ අළුත්වැඩියා කිරීම | 400 0 | 500 0 | 600 0 |
| 35. | සත්ව ආහාර ගබඩා කිරීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 600 0 |
| 36. | කොහු නිෂ්පාදන ආයතනයක් | 400 0 | 500 0 | 600 0 |
| 37. | වඩේ, කඩල, මුරුක්කු නිෂ්පාදනය හා අලෙවි කිරීම | 200 0 | 300 0 | 400 0 |
| 38. | දෙහි ආශ්‍රිත නිෂ්පාදන ආයතනයක් | 300 0 | 400 0 | 500 0 |
| 39. | කො ළකැඳ හෝ ඔසු පැන් අලෙවිය | 200 0 | 300 0 | 400 0 |
| 40. | ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 41. | කරවල අලෙවිසැලක් | 300 0 | 400 0 | 500 0 |
| 42. | කොප්පරා නිපදවීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 600 0 |
| 43. | කිරි එකතු කිරීමේ ස්ථානයක් | 200 0 | 300 0 | 400 0 |
| 44. | නාට්‍ය හා සංදර්ශන පැවැත්වීම | 400 0 | 500 0 | 600 0 |
| 45. | සැලුන් එකක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 46. | වාහන සේවා කිරීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 600 0 |
| 47. | ජංගම දැව ඉරුම්හලක් | 500 0 | 600 0 | 700 0 |
| 48. | ලී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 49. | පොල් ලෙලි කැපීම | 500 0 | 750 0 | 1,000 0 |

12-475/1

## ගිරිබාව ප්‍රාදේශීය සභාව

රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද - 2012 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 148 වැනි වගන්තිය ප්‍රකාර පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට 2012 වර්ෂය සඳහා වාහන පිළිබඳ බද්දක් පනවා අයකිරීමට ගිරිබාව ප්‍රාදේශීය සභාව තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

ආර්. එම්. ආනන්ද රූපසිංහ,
සභාපති,
ගිරිබාව ප්‍රාදේශීය සභාව,
තඹුත්ත.

2011 ඔක්තෝබර් මස 19 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| 01. | සෑම බයිසිකලයක් සඳහා - | |
| | *(අ)* වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | *(ආ)* වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| 02. | ආදායම් බලපත්‍ර ලබා නොගන්නා එන්ජින් ධාරිතාවය සී. සී. 50ට අඩු ධාරිතාවයකින් යුත් මෝටර් සයිකල් | 25 0 |

03-475/5

---

## දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව - 2012 වර්ෂය

ප්‍රචාරක දැන්වීම් - දෘශ්‍ය පරිසරය (සම්මත අතුරු ව්‍යවස්ථා අංක 39 කොටස)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 (අ) හා 122, 126 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ අතුරු ව්‍යවස්ථානුකූලව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, මුහුදට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් හෝ දැන්වීම් ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් (බැනර් ඇතුළුව) පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2012.01.01 වැනි දින සිට 2012.12.31 වැනි දින දක්වා බදු පනවා අය කිරීමට 2012.01.27 වැනි දින පැවති සභා රැස්වීමේදී අංක 10 -3 :1 දරන සහ සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සභාවේ අණ පරිදි,

ටී. එම්. ජයසේන,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2012 ජනවාරි මස 27 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය - අංක 01**

| | | | වර්ග අඩියකට ගාස්තුව<br>රු. ශත |
|---|---|---|---|
| 01. | ආකාස කොඩියක් (බැනරයක්) සති දෙකකට | | |
| | (1) | මුදල් ඉපයීමේ කටයුත්තක් නොවන විට | 10.00 |
| | (2) | මුදල් ඉපයීමේ කටයුත්තක් වූ විට | 40.00 |
| | (3) | ඉඩම්/වෙන්දේසි/විකිණීම් වෙනුවෙන් වූ විට (අතිරේක සතියක් සඳහා ඉහත ගාස්තුවලින් 25% කි) | |
| 02. | ස්ථාවර දැන්වීම් පුවරු (වර්ෂයකට) | | |
| | (1) | වර්ග අඩි 30 දක්වා (වර්ග අඩි 01ක් සඳහා) | 30.00 |
| | (2) | වර්ග අඩි 31 සිට 35 දක්වා (වර්ග අඩි 01ක් සඳහා) | 80.00 |
| | (3) | බිත්තියේ ඇඳ ඇති (වර්ග අඩි 01ක් සඳහා) | 20.00 |
| | (4) | විශේෂිත දැන්වීම් පුවරු (වර්ග අඩි 36ට වැඩි වර්ග අඩි 01ක් සඳහා) | 60.00 |

03-529/1

### දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද - 2012 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය මත කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ 2012 වර්ෂයේදී පහත අංක 01 උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙක් මතම එහි 11 වන තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අය කිරීමට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ 2012.01.27 වැනි දින පවත්වන ලද රැස්වීමේදී තීරණ අංක 10-3:1 යටතේ දැක්වෙන සභා සම්මුතිය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාවේ අණ පරිදි,

ටී. එම්. ජයසේන,<br>සභාපති,<br>ප්‍රාදේශීය සභාව,<br>දෙහිඅත්තකණ්ඩිය.

2012 ජනවාරි මස 27 වැනි දින,<br>දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| | | රු. ශත |
|---|---|---|
| 01. | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා, සෑම බයිසිකයලක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා - | 25 0 |
| | (අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | (ආ) වෙළඳ කාර්යය නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 04 0 |
| 02. | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| 03. | සෑම අත්කරත්තයක් සඳහා | 7 50 |
| 04. | සෑම රික්ෂෝවක් සඳහා | 10 0 |
| 05. | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| 06. | සෑම ඇතෙකු සඳහා | 50 0 |

03-529/4

---

### දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

*සතිපොළ බදු අයකිරීම*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වැනි වගන්තිය ප්‍රකාර පහත අංක 01 උපලේඛනයේ සඳහන් ආකාරයට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සතිපොළෙහි මෙම බදු අය කිරීම ප්‍රාදේශීය සභාව සෘජුව වෙළඳ අයිතිය බදු දීමේ බදුකරු විසින් 2012 වර්ෂය වෙනුවෙන් බදු අය කිරීමට 2012.01.27 දින පැවති සභා රැස්වීමේදී අංක 10:-03:1 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සභාවේ අණ පරිදි,

ටී. එම්. ජයසේන,<br>සභාපති,<br>ප්‍රාදේශීය සභාව,<br>දෙහිඅත්තකණ්ඩිය.

2012 ජනවාරි මස 27 වැනි දින,<br>දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සතිපොළෙහි වෙළඳුන්ගෙන් අයකළ හැකි උපරිම ගාස්තු

| | | රු. ශත |
|---|---|---|
| 01. | විවෘත කඩ (භූමිය වර්ග අඩි 01කට) | 05 0 |
| 02. | වෙළඳ ලොරියක් සඳහා | 750 0 |
| 03. | වෙළඳ වෑන් රථයක් සඳහා | 750 0 |
| 04. | වෙළඳ යතුරු පැදියක් සඳහා | 250 0 |
| 05. | වෙළඳ පා පැදියක් සඳහා | 100 0 |
| 06. | මාළු ලෑල්ලක් සඳහා (ලොරි සහ වෑන්) | 750 0 |
| 07. | අත්ට්‍රැක්ටරයක් සඳහා (වෙළඳාම් කිරීමේදී යොදන) | 500 0 |

03-529/2

---

### දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

සුනඛ බද්ද - 2012 වර්ෂය

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරිය)**

2012 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය ප්‍රකාර දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති කරනු ලබන සෑම බල්ලෙක් හා බැල්ලියක් සඳහා රු. 60 බැගින් 2012 වර්ෂය සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් පනවා ඇති බවත්, 2012 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීමට 2012.01.27 දින පැවති සභා රැස්වීමේදී තීරණය කරන ලදී.

සභාවේ අණ පරිදි,

ටී. එම්. ජයසේන,<br>සභාපති,<br>ප්‍රාදේශීය සභාව,<br>දෙහිඅත්තකණ්ඩිය.

2012 ජනවාරි මස 27 වැනි දින,<br>ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-529/3

---

### දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2012 වර්ෂය සඳහා එක් එක් සේවාවන් මත ගාස්තු අයකිරීම

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව විසින් 2012.01.27 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 10-3:1 යටතේ පහත අංක 01 උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුකරනු ලබන සේවාවන් වෙනුවෙන් එක් එක් කාර්යන් සඳහා බදු පනවා ගාස්තුවක් අයකරන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සභාවේ අණ පරිදි,

ටී. එම්. ජයසේන,<br>සභාපති,<br>ප්‍රාදේශීය සභාව,<br>දෙහිඅත්තකණ්ඩිය.

2012 ජනවාරි මස 27 වැනි දින,<br>ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | රු. ශත |
|---|---|---|
| 01. | පුස්තකාල පොර්ම ගාස්තු | 10 0 |
| 02. | සාමාජිකත්වය අලුත්කිරීමේ ගාස්තු | 25 0 |
| 03. | පාසල් ළමුන්ගෙන් සාමාජික ගාස්තු | 25 0 |
| 04. | වැඩිහිටියන්ගෙන් සාමාජික ගාස්තු | 50 0 |
| 05. | දඩ - දිනකට එක පොතකට | 01 0 |
| 06. | ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු | 300 0 |
| 07. | පරිසර ඉල්ලුම්පත්‍ර ගාස්තු | 300 0 |
| 08. | පරිසර බලපත්‍ර අලුත්කිරීමේ ඉල්ලුම්පත්‍ර | 100 0 |
| 09. | දැන්වීම් පුවරු ඉල්ලුම්පත්‍ර ගාස්තු | 100 0 |
| 09. | පාපැදි බලපත්‍ර සේවාගාස්තු | 26 0 |
| 10. | බිම් කුළිය වර්ග අඩියකට - බල ප්‍රදේශය තුළ පුද්ගලයන්ට | 3 50 |
| 11. | බිම් කුළිය වර්ග අඩියකට - බල ප්‍රදේශයෙන් පිට පුද්ගලයන්ට | 5 0 |
| 12. | කොන්ක්‍රීට් මිශ්‍රණය කුලියට දීම - දිනකට | 3,000 0 |
| 13. | ගල්රෝල කුලියට දීම - දිනකට | 3,500 0 |
| 14. | ජල බවුසරය පැය 12ක් තබා ගැනීමට | 500 0 |
| 14. | ජල බවුසරයෙන් ජලය හලා ගෙන ඒමට (සභාවේ වාහන මගින් ප්‍රවාහනය රහිතව) | 250 0 |
| 15. | පුටුවක් කුලියට දීම | 05 0 |
| 16. | ශබ්ද විකාශන යන්ත්‍රය පැය 12ක් සඳහා | 500 0 |
| 17. | තහඩු ආවරණය අඩි 20 x 20 දිනකට | 350 0 |
| 18. | අයාලේ යන ගවයින් ඇල්ලීමේ ගාස්තු - ලොකු ගවයෙකුට | 1,000 0 |
| 19. | අයාලේ යන ගවයින් ඇල්ලීමේ ගාස්තු - කුඩා ගවයෙකුට | 500 0 |
| 20. | අයාලේ යන ගවයින් ඇල්ලීමේ කණු ගාස්තු | 100 0 |
| 21. | ටිපර් රථය කුලියට දීම පළමු කි. මී. 25 සඳහා (වැඩිවන කි. මීටරයකට රු. 60 0) | 3,000 0 |
| 22. | බස් නැවතුම්පල කඩ කාමර කුලී ගාස්තුව | 150 0 |
| 23. | වීදිරේබා ඉල්ලුම්පත්‍ර ගාස්තු | 100 0 |
| 24. | වීදී රේබා/නොපවරා ගැනීමේ සහතිකය | 500 0 |
| 24. | ගොඩනැගිලි අනුකූලතා සහතිකය | 500 0 |
| 25. | වරිපනම් බදු නම වෙනස් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු | 1,000 0 |

03-529/6

---

## දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21,49,78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අතිවිශේෂ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව (260 වැනි අධිකාරය වන ) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 2012.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පහත අංක 01 උපලේඛනයේ සඳහන් ගාස්තු මෙම සභාවට අය කිරීමට 2012.01.27 වැනි දින පැවති සභා රැස්වීමේ දී අංක 10-3:1 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

තව ද මෙම සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන සියලුම ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් අයදුම්පතක් සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු බව මෙයින් දැනුම් දෙමි.

සභාවේ අණ පරිදි,

ටී. එම්. ජයසේන,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2012 ජනවාරි මස 27 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය - අංක 1

*ගොඩනැගිලි ඉදිකිරීම*

| *ගෙබිම විශාලත්වය (ව.අ.)* | *පදිංචිය සඳහා* රු. ශත | *වානිජ හෝ වෙනත් භාවිතය* රු. ශත |
|---|---|---|
| 750 හෝ ඊට අඩු | 500 0 | 750 0 |
| 751 සිට 1,000 | 750 0 | 1,000 0 |
| 1,001 සිට 1,100 | 1,000 0 | 1,250 0 |
| 1,201 සිට 1,500 | 1,250 0 | 1,750 0 |
| 1,501 සිට 2,000 | 1,500 0 | 2,250 0 |
| 2,001 සිට 2,500 | 2,000 0 | 2,750 0 |
| 2,501 සිට 3,000 | 2,500 0 | 3,500 0 |
| 3,001 සිට 3,500 | 3,000 0 | 3,500 0 |
| 3,501 සිට 4,000 | 4,000 0 | 4,250 0 |
| 4,001 සිට 5,000 | 5,000 0 | 6,500 0 |
| 5,000 සිට 6,000 | 6,000 0 | 8,000 0 |
| 6,001 සිට 8,000 | 8,000 0 | 10,000 0 |
| 8,001 සිට 10,000 | 10,000 0 | 20,000 0 |
| 10,000 වැඩි සෑම වර්ග අඩියක් සඳහා | 40 0 | 100 0 |

03-529/5

---

## දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149, වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු පහත දක්වා ඇති අංක 01 උපලේඛනයේ පරිදි දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2012 වර්ෂයට බලපැවැත්වෙන පරිදි පනවා එය 2012 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථමඅය කිරීමට 2012.01.27 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 10-3:1 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සභාවේ අණ පරිදි,

ටී. එම්. ජයසේන,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2012 ජනවාරි මස 27 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය අංක 02**

| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *රු. 750 සිට 1,500 දක්වා* | *රු. 1,500 සිට 3,000 දක්වා* | *රු. 3,000 සිට ඉහලට* |
|---|---|---|---|---|
| 01. | යන්ත්‍ර මඟින් කළුගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | බේකරියක් පවත්වාගෙන යාම | 300 0 | 750 0 | 100 0 |
| 03. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 04. | ලැඟුම්හලක්/නවාතැන් ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | හෝටලයක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | රෙස්ටුරන්ට් | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම (එළදෙනුන් 04ට වැඩි) | 200 0 | 400 0 | 600 0 |
| 08. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම (එළදෙනුන් 04ට අඩු) | 100 0 | 200 0 | 300 0 |
| 09. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 200 0 | 400 0 | 600 0 |
| 10. | පෞද්ගලික පොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 12. | බොරළු සහ පස් කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | සිසිල් බීම නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ග්‍රොස් එකකට වැඩි ප්‍රමාණයක් බීම බෝතල් ගබඩාකර තැබීම | 250 0 | 500 0 | 1,000 0 |
| 15. | අයිස් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් ගබඩා කර තැබීම (ගැලුම් 100ක්) | 200 0 | 400 0 | 600 0 |
| 17. | පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 10 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම | 200 0 | 500 0 | 750 0 |
| 18. | ග්‍රොස් 10කට වැඩි ප්‍රමාණයක් ගිනිපෙට්ටි ගබඩාකර තැබීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ගඩොල් හා උළු ගබඩාකර තැබීම | 750 0 | 900 0 | 1,000 0 |
| 20. | කුලියට දීම සඳහා පිඟන්, කෝප්ප බඩු හා පුටු දෙන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ධාන්‍ය හෝ මාංශ භෝග හෝ හොන්ඩර 05ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම | 300 0 | 600 0 | 900 0 |
| 22. | ස්වර්නාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම හෝ අළෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී ඉරුම් හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | අතින් ලී ඉරන ඉරුම්හලක් හෝ මෝලක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 25. | දැව ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | දර විකිණීම සඳහා ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 |
| 28. | තොග වශයෙන් විකිණීම සඳහා පිටි ලුණු හෝ සීනි හොන්ඩර 15ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩාකර තැබීම | 300 0 | 600 0 | 900 0 |
| 30. | මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | අලුත් හෝ පාවිච්චි කරන ලද ටයර් ටියුබ් 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම | 250 0 | 500 0 | 750 0 |
| 32. | පාවිච්චි කරන ලද කඩදාසිපත්‍ර කඩදාසි ගබඩාකර තැබීම | 300 0 | 600 0 | 900 0 |
| 33. | විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ට්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | කෘත්‍රිම පොහොර ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | කුකුලන් හෝ කිකිලියන් 100ට වැඩි ගණනක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | බැටළුවන් එළුවන් හෝ ඌරන් 10ට වැඩි ගණනක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | සිමෙන්ති කොට්ට 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | වඩුවැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | ගෘහභාණ්ඩ විකිණීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ගෘහභාණ්ඩ නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම (වර්ග අඩි 750ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම (වර්ග අඩි 750ට අඩු) | 250 0 | 500 0 | 750 0 |
| 45. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 1,000 0 |
| 46. | සපත්තු හෝ පාවහන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | කොහු මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500. 0 | 750 0 | 1,000.0 |
| 48. | රබර් මිශ්‍රිත කොහු මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | උළු මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 750 0 |
| 50. | මිරිස් මෝලක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 51. | වී මෝලක් පවත්වාගෙන යාම (කමත් රහිත) | 250 0 | 500 0 | 1,000 0 |

| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *රු. 750 සිට 1,500 දක්වා* | *රු. 1,500 සිට 3,000 දක්වා* | *රු. 3,000 සිට ඉහලට* |
|---|---|---|---|---|
| 52. | වී මෝලක් පවත්වාගෙන යාම (කමත් සහිත) | 500 0 | 750 0 | 900 0 |
| 53. | වී මෝලක් පවත්වාගෙන යාම (මධ්‍යම ප්‍රමාණය) | 300 0 | 600 0 | 750 0 |
| 54. | වී මෝලක් පවත්වාගෙන යාම (කුඩා ප්‍රමාණය) | 250 0 | 500 0 | 1,000 0 |
| 55. | හුණු මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | කළුගල් කැඩීම හා පිපිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | කබොක් හෝ බොරළු සෑදීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (වර්ග අඩි 750ට අඩු) | 500 0 | 750 0 | 900 0 |
| 59. | මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (වර්ග අඩි 750ට වැඩි) | 300 0 | 600 0 | 1,000 0 |
| 60. | යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 500 0 |
| 61. | බයිසිකල් අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 150 0 | 300 0 | 1,000 0 |
| 62. | භූමිතෙල් ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ගැලුම් 45ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | භූමිතෙල් ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ගැලුම් 45ට අඩු) | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | භූමිතෙල් ප්‍රවාහනය කිරීම සඳහා වාහනවලින් ප්‍රවාහනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | අම්ලකර වායුව පාවිච්චි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 67. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | ගුවන්විදුලි යන්ත්‍ර, රූපවාහිනි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 600 0 | 750 0 |
| 69. | තීන්ත වාර්නිස් කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | වයින් ස්ප්‍රීතු හෝ මෙතිලේටඩ් විකිණීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | අයිස්ක්‍රීම් හා ශීතකළ බීමවර්ග විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 1,000 0 |
| 72. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | රසකැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 600 0 |
| 74. | වාහන විකිණීමේ ස්ථානයක් (මෝටර් රථ හෝ මෝටර් සයිකල් ට්‍රැක්ටර් හා අත්ට්‍රැක්ටර්) | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (මැෂින් 10ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (මැෂින් 10ට අඩු) | 250 0 | 500 0 | 750 0 |
| 77. | ශීතකරණ උපකරණවල බහා මස් මාළු විකිණීම (කුකුල් මස් සඳහා) | 200 0 | 400 0 | 600 0 |
| 78. | කොන්ක්‍රීට් කණු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | සිමෙන්තිවලින් නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 650 0 | 750 0 | 1,000 0 |
| 81. | පොත් හා ලිපිද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | මිනීපෙට්ටි සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | මහන මැෂින් අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | සිංහල බෙහෙත් බඩු අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 400 0 | 600 0 |
| 85. | වාහන අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 86. | ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | මැටිවලින් නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 88. | සාප්පුබඩු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 89. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 90. | ඇලුමිනියම්, ප්ලාස්ටික්වලින් නිෂ්පාදිත ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 91. | පිඟන් වීදුරු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 92. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 400 0 | 600 0 |
| 93. | අත් ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 350 0 | 500 0 |
| 94. | සංචාරක වෙළඳ කටයුතු කරගෙන යාම | 150 0 | 300 0 | 500 0 |
| 95. | යාන්ත්‍රික බලයෙන් ක්‍රියා කරන ටයර් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 96. | නැවත පිරවූ ටයර් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 97. | ටයර් ටියුබ් වෝල්කනයිසින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 98. | තේ කුඩු තොග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 99. | මෝටර් රථ වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 100. | සිසිල්බීම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 101. | ඇලුමිනියම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 102. | කුඩා ප්‍රමාණයේ පිත්තල ඇලුමිනියම් වැඩපලක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 103. | මධ්‍යම ප්‍රමාණයේ  පිත්තල ඇලුමිනියම් වැඩපලක් පවත්වාගෙන යාම | 300 0 | 600 0 | 900 0 |
| 104. | ප්ලාස්ටික් ද්‍රව්‍ය හෝ ප්ලාස්ටික් බඩු නිපදවීමේ බලපත්‍රයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |

| *අනු අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *රු. 750 සිට රු. 1,500 දක්වා* | *රු. 1,500 සිට රු. 3,000 දක්වා* | *රු. 3,000 සිට ඉහලට* |
|---|---|---|---|---|
| 105. | ඡායා පිටපත් ගැනීම හා රෝනියෝ පිටපත් කරන ස්ථානයක් සඳහා | 250 0 | 400 0 | 500 0 |
| 106. | ගීත පටිගත කිරීමේ ස්ථානයක් සඳහා | 250 0 | 400 0 | 500 0 |
| 107. | රෙදිපිළි වෙළඳාම් කිරීමේ ස්ථානයක් සඳහා | 300 0 | 500 0 | 750 0 |
| 108. | දේපළ වෙළඳ සමාගමක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 109. | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 110. | කුඩා ප්‍රමාණයේ සිල්ලර කඩයක් සඳහා | 250 0 | 500 0 | 750 0 |
| 111. | මධ්‍යම ප්‍රමාණයේ සිල්ලර කඩයක් සඳහා | 300 0 | 600 0 | 900 0 |
| 112. | රේඩියේටර් නිපදවීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 113. | පෙට්‍රල් නිදන් කරන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 114. | ලාම්පු තෙල් නිදන් කරන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 115. | ඩීසල් නිදන් කරන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 116. | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 117. | මෙරට හෝ රට ලී වලින් භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 118. | වායුසමණ, ශීතකරණ යන්ත්‍ර, අධි ශීතකරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම | 300 0 | 500 0 | 750 0 |
| 119. | අළුත් මාළු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 120. | යකඩ බඩු අළෙවි කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 121. | පොහොර ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 122. | හුණු අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා | 300 0 | 600 0 | 900 0 |
| 123. | ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම සඳහා | 250 0 | 500 0 | 750 0 |
| 124. | වෑල්ඩින් වැඩපලක් සඳහා (කුඩා ප්‍රමාණය) | 250 0 | 750 0 | 1,000 0 |
| 125. | වෑල්ඩින් වැඩපලක් සඳහා (මධ්‍යම ප්‍රමාණය) | 500 0 | 750 0 | 1,000 0 |
| 126. | කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවිය සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 127. | සුරතල් සතුන් අලෙවිය සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 128. | වැලි ගොඩදැමීමේ ස්ථානයක් සඳහා (කාර්තුවක්) | 250 0 | 500 0 | 750 0 |
| 129. | වැලි කියුබ් 05කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීමේ ස්ථානයක් සඳහා | 300 0 | 600 0 | 750 0 |
| 130. | බෝට්ටු, ඔරු, පාරු සේවයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 131. | ප්‍රමාණයෙන් ටොන් 01ක් ඉක්මවන සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 132. | සීනිබෝල ද්‍රව්‍ය ග්ලූකෝස් ද්‍රව්‍ය නිපදවීම | 250 0 | 400 0 | 600 0 |
| 133. | රටබීමහලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 134. | පළතුරු විකිණීමේ ස්ථානයක් සඳහා | 200 0 | 400 0 | 600 0 |
| 135. | අශ්ව රේස් ඔට්ටුහලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 136. | ඇසිඩ් වර්ග බෝතල් කිරීම හා බෙදාහැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 137. | විදුලි බලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 138. | පුවත්පත් අලෙවි බලපත් ගාස්තු | 250 0 | 500 0 | 750 0 |
| 139. | යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 140. | පාපැදි අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 |
| 141. | දුරකථන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 142. | ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 143. | පරණ යකඩ එකතු කර විකිණීම | 250 0 | 500 0 | 750 0 |
| 144. | බැනර් ඇඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 500 0 | 750 0 |
| 145. | යකඩ තලන කම්හලක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |

03-529/7

---

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමේ ස්ථානයක් සඳහා ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2012 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂය නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී තීරණ අංක 92-2011 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබාගත යුතු සෑම කර්මාන්තයක් ම පවත්වාගෙන යාමේ ස්ථානය වෙනුවෙන් 2012 වර්ෂය සඳහා සභාපතිවරයාගෙන් වලංගු බලපත්‍රයක් ලබාගත යුතු බවත්, එසේ වලංගු බලපත්‍රයක් නොමැතිව ඒ යම් කර්මාන්තයක් පවත්වාගෙන යාම වරදක් බවත් මෙයින් තවදුරටත් නිවේදනය කරනු ලැබේ. එවැනි යම් කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන එක් එක් ස්ථානය වෙනුවෙන් 2012 වර්ෂයට

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ඉහත කී යෝජනාවේ සඳහන් ආකාරයෙන් ගාස්තුවක් නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,
සභාපති.

2011 නොවැම්බර් මස 25 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනය 1 වැනි කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් 2012 වර්ෂයේදී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවත් එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන්ම, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම ඒ උපලේඛනයේ 2 වැනි කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 1987 අංක 15 වැනි අධිකාරය වන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, 2012 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

I වැනි කොටස

1. ඌරන් ආදී සතුන් ඇති කිරීම
2. මාළු විකිණීම
3. මස් විකිණීම
4. ඝාතකාගාර
5. කොණ්ඩා සකසන්නන්ගේ සහ බාබර්වරුන්ගේ සාප්පු සහ සැලුන්හල්
6. පුපුරණ ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
7. ලොන්ඩරි
8. ලැගුම් නිවාස
9. හෝටල්
10. බත්කඩ, ආපන ශාලා හෝ තේ හෝ කෝපි කඩ
11. කිරි පට්ටි හා කිරි විකිණීම
12. බේකරි
13. අවමංගල්‍ය ශාලා සහ අවමංගල්‍ය කටයුතු භාරකරුවෝ
14. සිසිල් බීම නිෂ්පාදනය
15. අයිස් කර්මාන්තශාලා
16. පොහොර ගබඩා කර තැබීම
17. කුකුළු වෙළඳ පොළක් පවත්වාගෙන යාම
18. කළුගල් කැඩීම සහ කබොක් කැපීම
19. බොරළු හෑරීම
20. අශ්වයන් හා ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළඳපොලක්, ගාලක් හෝ ලැයිමක් තබා ගැනීම
21. පශු වෛද්‍ය හලක් පවත්වාගෙන යාම
22. පුවක් සකස් කිරීම
23. බැටළුවන් හෝ එළුවන් හෝ ඒ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල් කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම
24. උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
25. හුණු ගබඩාකොට තැබීම
26. බොම්බයි ලූණු හොණ්ඩර 5කට වඩා ගබඩා කොට තැබීම
27. අර්තාපල් හොණ්ඩර 5කට වඩා ගබඩා කොට තැබීම
28. පොල් කටු අඟුරු හොණ්ඩරයකට වඩා ගබඩා කර තැබීම
29. පරණ ලෝහ ගබඩා කර තැබීම
30. සිමෙන්ති හොණ්ඩර 25කට වඩා ගබඩා කර තැබීම
31. ලුනු දැමූ මාළු හොණ්ඩර 10කට වඩා ගබඩා කර තැබීම
32. මරා සකස් කළ කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම
33. ගම් වර්ග නිෂ්පාදනය
34. විෂබීජනාශක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
35. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නාවූ හෝ කට්ට කැපීම, කරනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම
36. ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
37. හිස් බෝතල 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
38. මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම
39. ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම
40. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම
41. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
42. පිටි හෝ කුළු බඩු ඇඹරීම
43. යන්ත්‍ර මගින් රෙදි මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම වෙනුවෙන් යන්ත්‍රයක් සඳහා
44. සත්වාහාර හැර, වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම (සමුපකාර සමිති හැර)
45. යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම
46. පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
47. පොලිතීන්, සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය සහ ගබඩාකර තැබීම
48. ඇසිඩ් ගැළුම් 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
49. කපුරු නිෂ්පාදනය
50. බූට් සපත්තු හෝ පාවහන් නිෂ්පාදනය
51. ඉටිපන්දම් නිෂ්පාදනය
52. වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම
53. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
54. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය
55. යන්ත්‍රානුසාරයෙන් තල තෙල් නිෂ්පාදනය
56. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩාකොට තැබීම
57. ගිනි පෙට්ටි නිෂ්පාදනය
58. ඉඹුල් පුළුන් ගබඩා කොට තැබීම
59. පොල්තෙල් ගැළුම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
60. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කොට තැබීම
61. ඇසිටලීන් නිෂ්පාදනය
62. උළු 500කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
63. ගඩොල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
64. සිගරට් නිෂ්පාදනය
65. බීඩි නිෂ්පාදනය
66. තීන්ත හෝ වාර්නිෂ් හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
67. කොහු නිෂ්පාදනය
68. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි හැර වෙනත් ගෝනි 100 කට වැඩියෙන් ගබඩාකොට තැබීම
69. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150කට වැඩියෙන් ගබඩා කොට තැබීම
70. රස කැවිලි නිෂ්පාදනය

71. පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
72. ලී පෙට්ටි සෑදීම
73. ඔක්සිජන් සහ වැල්ඩින් වැඩකරනු ලබන්නාවූ ද, මෝටර් වාහන අළුත්වැඩියා කරන්නාවූ ද ගරාජයක් නොවන්නාවූ ද වෙනත් ආයතනයක් පත්වාගෙන යාම
74. මෝටර් වාහන අළුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම
75. මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
76. යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නාවූ ද මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
77. පොල් තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
78. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය
79. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පදනය සහ /හෝ ගබඩා කර තැබීම
80. අළුත් ටයර් හෝ ටියුබ් 150කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
81. පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250කට අධික ප්‍රමාණයක් ගබඩාකර තැබීම
82. ස්ප්‍රේ පේන්ටින් වැඩකරන ස්ථානයක් පවත්වාගෙන යාම
83. ශීතකරණය අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
84. යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නා වූ ද, ඇඳුම් මැසීම කරනු ලබන්නාවූ ද ආයතනයක් පවත්වාගෙන යාම
85. ඩ්‍රයි ක්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම
86. යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම, කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම
87. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නාවූ ද ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, , කරනු ලබන්නාවූ ද ගරාජයක් නොවන්නාවූ ද ආයතනයක් පවත්වාගෙන යාම
88. අශුද්ධ ලෝහ උණු කිරීම
89. ගම්, ඉටි හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම
90. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය
91. තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
92. ශීතකරණ අළුත්වැඩියා කිරීම, රීකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
93. මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
94. ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම

*2 වැනි කොටස*

| | *1 වැනි තීරුව වාර්ෂික වටිනාකම* | *11 වැනි තීරුව බලපත්‍ර ගාස්තුව රු. ශ.* |
|---|---|---|
| 1. | රු. 750 නොඉක්මවන අවස්ථාවක | 500 0 |
| 2. | රු. 750 ඉක්මවන නමුත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක | 750 0 |
| 3. | රු. 1,500 ඉක්මවන අවස්ථාවක | 1,000 0 |

ඉහත 1 වැනි කොටසේ සඳහන් කර්මාන්ත අතරින් අංක 9 යටතේ සඳහන් කිසියම් හෝටලයක් හෝ අංක 10 යටතේ සඳහන් කිසියම් ආපන ශාලාවක් හෝ, අංක 8 යටතේ සඳහන් වන කිසියම් නවාතැන් පොළක් හෝ ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ පිළිගනු ලැබ ඇත්තාවූ ද වන අවස්ථාවක, ඉහත 2 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළහි හෝ 2011 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු ය.

03-526/7

---

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 92-2011 යටතේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,
සභාපති,

2011 නොවැම්බර් මස 25 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 වගන්තිය අනුව නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර නොච්චියාගම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, මාවතකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2012 වර්ෂයට පනවා අය කළ යුතු බවත් නොච්චියාගම ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

*උපලේඛනය*

| | | රු. ශත. |
|---|---|---|
| 01. | බිත්ති හා තාප්ප උපයෝගී කර ගන්නා ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩියකට | 100 0 |
| 02. | *ස්ථිර දැන්වීම් පුවරු ගාස්තු* | |
| | (i) විනිවිද පෙනෙන දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට | 25 0 |
| | (ii) (විදුලි ආලෝකය කරන ලද දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට | 35 0 |
| 03. | *ඉටිරෙදි හෝ රෙදි මගින් කරන ලද දැන්වීම් සඳහා :* | |
| | (i) වාණිජ දැන්වීම් සඳහා වර්ග අඩියකට | 15 0 |
| | (ii) වෙනත් විවිධ සුභසාධක කටයුතු සඳහා - වර්ග අඩියකට | 5 0 |

03-526/6

---

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 92-2011 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත්වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් (30) සම්පූර්ණ වූ වහාම 2012 වර්ෂය සඳහා වන මෙම බද්ද නොච්චියාගම ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,<br>සභාපති,<br>නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 25 වැනි දින,<br>නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය සහ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2012 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අයකිරීමට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.”

*උපලේඛනය*

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* රු. ශත. |
|---|---|---|
| (i) | මෝටර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් සඳහා- | |
| | (අ) එය වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් | 10 0 |
| | (ආ) එය වෙළඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම් | 5 0 |
| (iii) | සෑම කරත්තයක් සඳහා ම | 20 0 |
| (iv) | සෑම අත්කරත්තයක් සඳහා ම | 10 0 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහා ම | 75 0 |
| (vi) | සෑම අශ්වයෙකු , පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| (viii) | සෑම අලියෙකුම සඳහා | 50 0 |

(2) රෝදවල විෂ්කම්භය අඟල් 26ට නොවැඩි ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා භාවිත කෙරෙන අත් කරත්ත සහ වෙළෙඳ කටයුතු සඳහා භාවිතා නොකෙරෙන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් කෙරේ.

03-526/11

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

2012 වර්ෂය ව්‍යාපාර බද්ද පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 92-2011 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,<br>
සභාපති.<br>
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 25 වැනි දින,<br>
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ ද හා වෘත්තියක් නොවන්නාවූ ද කිසියම් ව්‍යාපාරයක් නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2012 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2012 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරත්නී ය."

***උපලේඛනය***

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව ගෙවිය යුතු වාර්ෂික බද්ද* |
|---|---|---|
| | *බද්ද අදාල වන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *රු. ශත* |
| 01. | රු. 6,000 දක්වා | කිසිවක් නැත |
| 02. | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 03. | රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| 04. | රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| 05. | රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| 06. | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

03-526/5

---

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම පිළිබඳ ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 92-2011 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,<br>
සභාපති,<br>
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 25 වැනි දින,<br>
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

"නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.02.28 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග සහ රඟ දැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ඒ අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන ගාස්තු පහත පරිදි එනම්,

1975/77 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත අනුව :

| | රු. ශත |
|---|---|
| (01) ඉල්ලුම් පත් ගාස්තුව | 250 0 |
| (02) වාර්ෂික බලපත්‍ර ගාස්තුව | 3,000 0 |

*(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 03 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තුව*

| | *එක් දිනකට* | *එක් සතියකට දින 07ක් හෝ ඊට අඩු* | *මසක් හෝ ඉන් කොටසකට* | *දෙසැම්බර් මාසයෙන් අවසන් වන එක් වර්ෂයකට* |
|---|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| ආසන 199ට වැඩි නොවූ විට | 10 0 | 25 0 | 50 0 | 250 0 |
| ආසන 199ට වැඩි එහෙත් 399 ට වැඩි නොවූ විට | 15 0 | 35 0 | 75 0 | 350 0 |
| ආසන 499ට වැඩි නොවූ විට | 25 0 | 50 0 | 100 0 | 400 0 |
| ආසන 499ට වැඩි වූ විට | 50 0 | 75 0 | 150 0 | 500 0 |
| ව්‍යාපාර නොවන ආඥාපනතේ විස්තර කෙරෙන ආධාර රඟ දැක්වීමකට | 15 0 | 25 0 | 100 0 | 200 0 |

මෙම තීරණය 2012.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයිද නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය. "

03-526/10

---

## නොච්චියාගම ප්‍රාදේශීය සභාව

*2012 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම*

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 92-2011 යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 25 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

නාගරික සංවර්ධන අධිකාරිය මගින් සංවිධානය කරන ලද 2009.04.13 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ I කොටස (II) ඡේදයේ පළ කරන ලද කොන්දේසි සහ නීතිරීති නොච්චියාගම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ක්‍රියාත්මක කිරීමටත් නොච්චියාගම ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

### යෝජනාව

නොච්චියාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටුකරන පහත සඳහන් සේවා සහ වෙනත් ආනුෂංගික කාර්යයන් ඉටු කිරීමේ දී මහ නගර සභා අරමුදලට අය කර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2012 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත්, නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

*උපලේඛනය*

*2012 වර්ෂය සඳහා සේවා ගාස්තු පැනවීම*

| | *සේවාව* | *ගාස්තුව රු. ශත.* |
|---|---|---|
| 01. | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 300 0 |
| 02. | කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම | 500 0 |
| 03. | වීථි රේඛා/නොපවරා ගැනීමේ සහතික සඳහා පරීක්ෂණ ගාස්තුව | 350 0 |
| 04. | වීථි රේඛා සහ පවරා නොගැනීමේ සහතික නිකුත් කිරීම | 250 0 |
| 05. | හිමිකම් සහතික නිකුත් කිරීම | 50 0 |
| 06. | ගොඩනැගිලි පිළිබඳව සීමා සහතිකයක් නිකුත් කිරීම | 50 0 |
| 07. | ජල සැපයුම් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම | 50 0 |
| 08. | ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු | 100 0 |
| 09. | *පුස්තකාල අයැදුම්පත් නිකුත් කිරීම* | 10 0 |
| | (i) පුස්තකාල සාමාජිකත්වය වාර්ෂිකව අලුත් කිරීම | 50 0 |
| | (ii) පුස්තකාල සාමාජිකත්වය මුල්වරට ලබා ගැනීම | 60 0 |
| 10. | වරෙන්තු ගාස්තුව (වරිපනම් බදු/අක්කර බදු) - බදු මුදලින් 10% | |
| 11. | දේපළ අයිතිය හැරවීමේ අයැදුම් පත්‍රය | 100 0 |
| 12. | *සුසානභූමි ගාස්තු :* | |
| | (i) භූමිදානය කිරීම හෝ ආදාහනය කිරීම සඳහා | 50 0 |
| | (ii) තැන්පත් කිරීම සඳහා වර්ග අඩි 01කට | 50 0 |
| 13. | *ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර ගාස්තු -* | |
| | (1) නාගරික ප්‍රසිද්ධ බලපත්‍ර සංදර්ශන සඳහා දිනකට | 500 0 |
| | (2) ගම්බද ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර සඳහා දිනකට | 250 0 |
| | (3) තාවකාලික චිත්‍රපටි දර්ශන, මැජික් දර්ශන, සර්කස් දර්ශන සඳහා එක් දිනකට | 100 0 |
| | ඊට වැඩිවන සෑම දිනකටම | 25.00 බැගින් |
| 14. | බොරළු ප්‍රවාහනයේ දී ප්‍රාදේශීය සභා මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් කියුබ් එකක් සඳහා (හානි සිදුවන නිසා) | 50 0 |
| 15. | වරිපනම් තක්සේරු ලේඛනයේ බදු හිමිකම සංශෝධනය කිරීම සඳහා ගාස්තු | 500 0 |
| 16. | මාර්ග දෙපස ඇති අනවසර වෙළඳ මැසි සඳහා | 250 0 |
| 17. | මහවැලි ක්‍රීඩාංගනය වෙන් කිරීම එක් දිනකට | 500 0 |
| 18. | ගොඩනැගිලි ඉල්ලුම්පත් ලියාපදිංචි කිරීම | 350 0 |

---

03-526/4

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

පුස්තකාල ගාස්තු පැනවීම - 2012 වර්ෂය

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 92-2011 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,
සභාපති,
නොච්චයාගම ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 25 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල බලතල ප්‍රකාර එකී අතුරු ව්‍යවස්ථාවේ සඳහන් තැන්පත් මුදල වන, මුල්වරට සාමාජිකත්වය ලබා ගන්නා තැනැත්තෙකු වන විට රු. 60ක් විය යුතු බවත්, එම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දඩය එක් පොතක් වෙනුවෙන්, පහත පරිදි එනම්, ප්‍රමාද වන දින ගණන අතරට ගැනෙන බදාදා සහ රජයේ නිවාඩු දින අත්හළ විට ඉතිරි වන දින ගණන,

දින 01 සිට දින 30 දක්වා දිනකට රු. 3.00 බැගින්,
දින 31 සිට දින 90 දක්වා දිනකට රු. 3.50 බැගින්,
දින 91 සිට දින 180 දක්වා දිනකට රු. 4.00 බැගින්,
දින 181 කට වැඩි වන විට දිනකට රු. 5.00 බැගින්

විය යුතු ය යන්න සහ මෙම තීරණය 2012 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.''

03-526/9

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

කර්මාන්ත බද්ද පැනවීම - 2012 වර්ෂය

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 92-2011 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. කුමාරසිරි,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 25 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නාවූ කිසියම් කර්මාන්තයක් නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2012 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2012 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක්ම, එකී කර්මාන්ත බද්ද 2012 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර නොච්චියාගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

*උපලේඛනය*

| | *I වැනි තීරුව වාර්ෂික වටිනාකම* | *II වැනි තීරුව ගෙවිය යුතු බද්ද* |
|---|---|---|
| | | *රු. ශ.* |
| 1. | රු. 750 නොඉක්මවන අවස්ථාවක | 500 0 |
| 2. | රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 750 0 |
| 3. | රු. 1,500 ඉක්මවන අවස්ථාවක් | 1,000 0 |

03-526/8

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.